

තල්, පොල් සහ මුතු පබා - 18

# බ්‍රිතාන්‍ය සංචාරකයා කුතුහලයට පත් කළ ආදම් ගේ කන්ද - 5

ශ්‍රියා කුමාරසිංහ - නවසීලන්තයේ සිට

*කෙසේ හෝ මට දැන ගැනීමට ලැබුණු ආකාරයට එහිදී සිදුවන මරණ සංඛ්‍යාව බහුලය. වන්දනා ගමනකදී වන්දනාකරුවෙකු හෝ දෙදෙනෙකු නැති වීම පිට රටට හඬගා කීමට හෝ පුදුම වීමට කාරණයක් නොවේ. සත්තකින්ම වඩාත් විස්මය දනවන කාරණය නම් එම දම්වැල එතැනට කෙසේ පැමිණියාද යන්නය.*



## සීතාවන්ගේ දෙව් විමන

හාත්පස සිසාරා විහිදෙන මනරම් දසුනින් නෙත් මුදවා ගෙන ඉහලින් පෙනෙන වළාකුළු රාජ්‍යය දෙසට දෙපා හැසිරවීමට මට සෑහෙන ආයාසයක් දැරීමට සිදුවුණි. නමුත් ඔසවන හැම අඩියක් පාසාම දකින්නට ලැබුනේ වඩාත් කුතුහලය දනවන සුළු කලින් නොදුටු ආකාරයේ පියකරු දසුන්ය. කෙසේ හෝ මග ගෙවා අප අවසානයේ සීතා ගඟ නැතහොත් සීත ගඟුල අද්දරට පැමිණියෙමු. මේ ස්ථානය සියළුම බැතිමතුන් දිය නා පිරිසිදු වෙන ස්ථානය පමණක් නොව රාමා ගේ බිරිඳ සීතාවන් සිරකාරියකව සිටි සමයේ වාසය කල ස්ථානය ද වේ. එවක් පටන් ඇය දිය නෑම නිසා පාරිශුද්ධියට පත් සීත ගඟුල ද ඉන්දියාවේ ඇති බොහෝ ගංගාවන් මෙන් සියළු දෙනාගේ වන්දනාමානයට පත් විය. ජල දහර හඬ නගමින් ගස් වැල් වල සෙවණ ලබමින් තියුණු කඳු බෑවුම්වලින් හැඩ ගැන්වෙමින් මහත් චංචල වූ ගමනක යෙදෙයි. විශාල ගල් කුළු පාමුල වීදුරු මෙන් දිස්වන ජල තටාකයන්හි ආගමික වතාවත්හි යෙදෙන බැතිමතුන් නිරන්තරව දැක ගත හැකිය. සීත ගඟුලෙන් දිය නා පිරිසිදු නොවී ඉන් ඔබ්බට ගියහොත් එතෙක් දැරූ සියළු ව්‍යායාමයන්ගේ ප්‍රතිඵලය පුස්සක් වන බැවිනි. වාර්ෂිකව බැතිමතුන් සිරිපා වන්දනා-වේ යෙදෙන සමයේ මෙහි ළඟා වෙන කෙනෙකුට නිසැකවම දක්නට ලැබෙනුයේ ඉතා විචිත්‍රවත් දසුනකි. ආසියාවේ සියළු දෙසින් ඇදෙන බැතිමතුන් මෙහිදී එකට මුණ ගැසෙති. කොටසක් ජල ක්‍රීඩා හෝ සීතාවන්ට පූජෝපහාර පවත්වන අතර තවත් පිරිසක් ඔවුන්ගේ වර්ණවත් ඇඳුම් හිරු රැසින් වේලෙන්නට වනා කතාබහේ යෙදෙමින්, ආහාර අනුභව කරමින් හෝ නිමක් නැති බුලත් සැපීමක යෙදෙමින් කාලය ගත කරති.

නුදුරින් පිහිටි දිවියාගල නම් වූ ගල්කුළක් පෙන්වූ සහායකයා එය කොටියෙකුගේ පා කොට්ටයක් බව කීවද මිථ්‍යාදෘෂ්ටික මට නම් එම රුව හා එහි ප්‍රබන්ධ කතාව පෙනුනේ මැකියුලේ ගේ පිටුවක එන බළලෙකුගේ අතක් මෙනි. සැතපුම් බාගයක් ඉහලින් සීත ගඟුල තියුණු බෑවුම් සහිත කුඩා කඳුරක් මැදින් ගලයි. ඒ මග දිගට තැනින් තැන ඇති රළු දාරමය පියගැට අපගේ ගමන මඳක් පහසු කරවයි. එක් පසෙකින් ඇත්තේ පුළුල්ව පැතිරී ගිය, නැගීමට ඉතා දුෂ්කර, මටසිලුටු තනි ගල් පව්වකි. එහි උස ප්‍රමාණ හතරකින් යුතු පඩි දෙසීයක් තනා ඇත. අවසාන භාගයේ තනා ඇති පඩි අනූවක් සහිත කොටස සාමාන්‍ය උසින් යුතු වන අතර නැගීමට වඩාත් පහසු පරිමාණයෙන් තිබේ. මෙම පඩි තනවා ඇත්තේ කිසියම් රජ කෙනෙකු විසිනි. ඒ ආසන්නයේ ඔහුගේ හැඩරුව හා චරිතාපදානය දළ සටහනක ආකා-ාරයෙන් කැටයම් කොට ඇත. සැලිස්බරි තැන්නේ ඇති ගල් කණු හා සමානව මේ ගල් පඩි පිළිබඳව බෞද්ධයින් පවසන දින වකවානු සාමාන්‍ය මිනිසෙකුට නිවැරදි යයි පිළිගත හැකි සීමාවෙන් ඉතා බැහැ-ැරය.

දැන් අපි ළඟා වෙමින් සිටින්නේ අපේ වෙහෙසකර වන්දනා ගමනේ ඉලක්කය කරාය. ඒ හා සමගම අපි මෙතෙක් විඳි සියල්ලටම වඩා ඉතා වේදනාකාරී බාධකයන් හා මුහුණට මුහුණ ලා සිටින්නෙමු. හුස්ම ගැනීමට පවා අපහසු, අධික සුළං සහිත කඳු මුදුනේ ඇති ගල් පඩිපෙලෙහි සිට එක් පයක් ඔසවා නැවත බිම තබන කාලය අතරතුර වන්දනා කරුවෙකු තම ජීවිතය අතෙහි රඳවා ගෙන සිටින සෙයකි. සමහර විට ඉතා පලපුරුදු ඇල්පයින් කඳු නගින්නෙකුට මෙය එතරම් අසීරු කාර්යයක් නොවිය හැකි නමුදු, ඉහළ මට්ටමක සරඹ පුහුණුවක් හෝ නොමැති සාමාන්‍ය ගණයේ සංචාරකයෙකුට මුහුදු මට්ටමේ සිට අඩි හත් දහසක් උසින් පිහිටි, සුදු පැහැයෙන් ගිනියම් වූ, හාත්පසින් කිසිවක් නොමැති රළු කඳු මුදුනක ඉහළ කොණ ගලට පමණක් සවි කොට ඇති, අනෙක් කොණ ඔබේ සිරුරට පහළින් කිසියම් ගීතයක තනුවකට ඔහේ පැද්දී යන, හැඩය විකෘති වී




ගිය මලකඩ කෑ යකඩ දම්වැලක එල්ලී, එක පයක් එහි රඳවා, පහත බැලීමට තරම් සිතේ ධෛර්යයක් නොමැතිව අසරණ ලෙස අනිත් පය රැඳවීමට තැනක් සොයමින් බලවත් උත්සාහයක යෙදෙනු වෙනුවට ඉන් වැලකී සිටීමට කිසියම් සාධාරණ හේතුවක් තිබිය හැකිය.

බලාපොරොත්තු සුන් වී ගොස් ග්‍රහණය කරගත හැකි යමක් සොයමින් එසේ එල්ලී

*අශ්‍රප්ට අනුව, එම අත්වැල් තනාදීම පිළිබඳව අප මහා ඇලෙක්සැන්ඩර්ට ණය ගැතිය. ඔහු මෙසේ කියයි. මනුෂ්‍ය වර්ගයාගේ සුබ සෙත සඳහා මහා ඇලෙක්සැන්ඩර් නොයෙකුත් දේ කලේය. සෙරන්ඩිබ් කන්ද නැගීමට යන සංචාරකයන්ට එය පහසු කරලීම සඳහා තඹ සහ යකඩ මුදු යොදා පෑස්සූ දම්වැල අද දක්වා ඉතිරිව පවතී.*

සිටිද්දී ඔබට ඉහලින් ඇති ඔබ ළඟා වීමට තැත් කරන අනුකම්පා විරහිත කඳු මුදුන ඔබේ දෑස් වලට වේදනා ගෙන දෙයි. ඔබට පහතින් ඇති ප්‍රපාතයේ කුමක් ඇද්දැයි, කොහේ හෝ වේවා, එතැනට ගොස් බලන තෙක් කියන්නට කිසිවක් නොදනී. ඒ මොහොතේ ලැබෙන කුමන ආකාරයක හෝ උපකාරයකට මම බෙහෙවින් ස්තුතිවන්ත වුනෙමි. මේ පරණ යකඩ දම්වැල ගැලවී ආවොත්?, කොයි මොහොතේ හෝ එය පාස්සා ඇති තැනින් ගැලවී යනු ඇත, ඒ මොහොත දැන් වෙන්නට බැරිද? යන හොල්මන් අදහස මගේ හිසෙන් එළවා දැමීමට හැකි වුණි නම් මීට පෙර කී දෙනෙක් නම් මේ ආකා-ාරයෙන්ම තමා පෙර කල පව් වලට සමාව අයැද සිටින්නට ඇත්දැයි සිතා එමගින් සිත සනසා ගන්නට ඉඩ තිබුණි. ඒ සිතුවිල්ලත් සමග අඩි දහසක් පහළ තැනකින් කුඩාවට කැබලි වී ගිය මගේ සිරුර එකතු කර ගන්නා ආකාරය මට කෙසේ දැනේවිදැයි, එමෙන්ම සුදු වතින් සැරසුනු, කිසිදු ප්‍රසිද්ධියක් නැති ඉංග්‍රීසි කාරයෙකු හඳුනා ගැනීමට ඉතිරි වන සාක්ෂි කෙතරම් අල්ප වනු ඇද්දැයි සිතේ මවා ගැනීමට යත්න දැරුවෙමි.

මේ පොත් පිටුව මෙන් තුන් ගුණයක් පමණ විශාල තැනිතලා ස්ථානයකට පය ගැසීමට යන්තම් ඉඩක් ලද මො-හොතක පහත භූමි ප්‍රදේශයේ දසුන-ක් සිතට හොරා උකහා ගැනීමට යත්න දරමින් මෙතැනදී අනතුරු සිදුවී නැද්ද යන්නත්, ප්‍රෞඪ බ්‍රාහ්මණයෙක් හා නිහතමානී ෂින්තෝ අදහන්නෙක් කෙනෙක් උඩටත් අනෙකා පහළටත් යද්දී එකම දම්වැලේදී මුණ ගැසුණොත් කුමක් විය හැකිද යන්නත් මා සමග සිටි කුලී කාරයාගෙන් මුදු හඬින් රහසින් ඇසීමි. මගේ දෙවන ප්‍රශ්නයට ඔහුට පිළිකුරු දී ගත නොහැකි වුවත් පළමු ප්‍රශ්නයට නම් මා මීට පෙර ඇසූ බොහොමයක් එවැනි අනුමාන ප්‍රශ්නවලදී ඔහු ඒවා සනාථ කළ ආකාරයටම, සිය ජාතියට ආවේනික සැහැල්ලු සිනහවක් පා කෙනෙකු එවැනි විපතකට මුහුණ පා ඇත්තේ ඉතා කලාතුරකින් බව කීවේය. කෙසේ හෝ මට දැන ගැනීමට ලැබුණු ආකාරයට එහිදී සිදුවන මරණ සංඛ්‍යාව බහුලය. වන්දනා ගමනකදී වන්දනාකරුවෙකු හෝ දෙදෙනෙකු නැති වීම පිට රටට හඬගා කීමට හෝ පුදුම වීමට කාරණයක් නොවේ. සත්තකින්ම වඩාත් විස්මය දනවන කාරණය නම් එම දම්වැල එතැනට කෙසේ පැමිණියාද යන්නය. ඉතාමත්